# විශ්වවිද්‍යාල රෝහල
# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

## පුරප්පාඩු – ස්ථිර පදනම මත

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහලෙහි පහත සඳහන් තනතුරු සඳහා අදාළ සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 1. විශේෂඥ වෛද්‍ය නිලධාරි (නිර්වින්දන)

**සුදුසුකම්:**

I. 2018 අංක 28 දරන වෛද්‍ය (සංශෝධන) පනතට අනුව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි/ ලියාපදිංචි විය හැකි වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු විය යුතුය.

හෝ

II. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය සහිත වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු වීම.

සහ

III. විශේෂඥ වෛද්‍ය (MD / MS) උපාධිය සමඟ කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මාණ්ඩලික සහතිකය (Board Certification) ලබා තිබීම. (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 2014.10.11 දින නිකුත් කරන ලද 1883/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ I වන ඇමුණුම).

සහ

IV. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

**හෘද සැත්කම් (නිර්වින්දනය) පිළිබඳ සේවා පළපුරුද්දක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකා බලනු ලැබේ.**

**වැටුප් පරිමාණය:**

MC 1-2 රු.(91,645 - 12 × 2,700 - 124,045)

* විශේෂඥ වෛද්‍ය නිලධාරි MC 1-2 පියවර 01 හි තබනු ලැබේ. - රු. 91,645.00

## 2. හෙද නිලධාරි

### 1. හෙද නිලධාරි - I ශ්‍රේණිය

**සුදුසුකම්:**

I. II වන ශ්‍රේණියේ හෝ I වන ශ්‍රේණියේ හෝ නිලධරයෙකු වීම.

සහ

II. දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වී තිබීම.

සහ

III. පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහ

IV. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර පහක් (05) තුළ සතුටුදායක මට්මට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 7 - රු.(33,295 - 10 × 445 - 11 × 660 - 10 × 730 - 5 × 750 - 59,805)

*හෙද නිලධාරි - I ශ්‍රේණිය MT 7 පියවර 23 හි තබනු ලැබේ - රු. 45,735.00 + අනුමත අනෙකුත් දීමනා.

### 2. හෙද නිලධාරි - III ශ්‍රේණිය

**සුදුසුකම්:**

I. සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශය මගින් හෝ හෙද සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක හෙද ඩිප්ලෝමා පාඨමාලාව හෝ උපාධිය සම්පූර්ණ කර තිබීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවට අයත්, ජීව විද්‍යාව/ගණිතය/කෘෂි විද්‍යාව විෂය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම. පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) එකවර සමත්වීම.

සහ

III. සිංහල / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 7 - රු.(33,295 - 10 × 445 - 11 × 660 - 10 × 730 - 5 × 750 - 59,805)
*හෙද නිලධාරි – III ශ්‍රේණිය MT 7 පියවර 01 හි තබනු ලැබේ.
- රු. 33,295.00 + අනුමත අනෙකුත් දීමනා.

## 3. විද්‍යුත් බන්තු රේඛන සටහන්කරු

**<u>සුදුසුකම්</u>**

I. සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් එක්වරකදී සමත් වීම.

සහ

III. සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් මෙහෙයවනු ලබන විද්‍යුත් බන්තු රේඛණ සටහන්කරු එක් අවුරුදු (01) පූර්ණකාලීන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 4 - රු.(31,960 - 10 × 445 - 11 × 660 - 10 × 730 - 10 × 750 - 58,470)
* විද්‍යුත් බන්තු රේඛන සටහන්කරු – III ශ්‍රේණිය MT 4 පියවර 01 හි තබනු ලැබේ.
- රු. 31,960.00 + අනුමත අනෙකුත් දීමනා.

**<u>පොදු කොන්දේසි</u>**

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

2. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල තුළ හෝ විශ්වවිද්‍යාල පරිපාලනය මගින් තීරණය කරනු ලබන දිවයිනේ ඕනෑම ස්ථානයක හෝ සේවය කිරීමටත් තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

3. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

4. අයදුම්පත් භාර ගනු ලබන අවසන් දිනය වන විට අයදුම්කරුවන් සියලු සුදුසුකම් සම්පූර්ණ කොට තිබිය යුතුය.

5. මෙම තනතුරු ස්ථිර වන අතර, හෙද නිලධාරි III ශ්‍රේණිය හා විද්‍යුත් බන්තු රේඛන සටහන්කරු – III ශ්‍රේණිය තනතුරු වසර තුනක (03) පරිවාස කාලයකට යටත්වන අතර විශේෂඥ වෛද්‍ය නිලධාරි සහ හෙද නිලධාරි I ශ්‍රේණිය තනතුරුවල රාජ්‍ය සේවයෙහි රැකියාවක නියුතුව සිටි නිලධාරින් වසර එකක (01) පරිවාස කාලයකට යටත් වේ.

6. සේවක අර්ථසාධක අරමුදල සඳහා ඔබගෙන් 10% දායකත්වයක්ද විශ්වවිද්‍යාලයෙන් 15% දායකත්වයක්ද දරන අතර සේවක භාරකාර අරමුදල සඳහා විශ්වවිද්‍යාලයෙන් 3% දායකත්වයක් දරනු ලැබේ (පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නියම කරනු ලැබිය හැකි සංශෝධන වලට යටත්ව).

7. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයක් සමගින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතිකවල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් 2024.02.19 දිනට හෝ ඊට පෙර "විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර" යන ලිපිනයට යොමු කළ යුතු අතර, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

8. අයදුම්කරුවන් කෙටි ලයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ.

9. අසම්පූර්ණ, ප්‍රමාද වී ලැබුණු සහ අදාළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. අයදුම්පත් භාගත කර ගැනීමට/ වැඩි විස්තර සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියට (www.kdu.ac.lk) පිවිසෙන්න.

**www.kdu.ac.lk**